RECEIVED 26/03/2024 17:05

26/03 2024 05:16 PM FAX 0001

(04)

# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
# வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
# Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය, කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo - 01

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilization & National Policies

මගේ අංකය / எனது இல. / My No. : TIP/TP/01/10 (213)

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2024.03. 26

RECEIVED
26 MAR 2024
S.L. Customs
P.P.& R. Division
840

රජයේ මුද්‍රණාලයාධිපති
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මියණි,

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන සහ 5 වන වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් පනවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන සහ 5 වන වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය **2024.03.26** දිනැති අංක **2377/17** දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 400 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ විධි විධාන අනුව මෙම ගැසට් නිවේදනය අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බැවින්, මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී,

ASC (DOPL)
DDC (Tariff)
F.N.A. pl,
P/ Issue [Public] DOPL for Inform & compliance of officers
26/03/2024
DC (PP&R)

**කේ. ඒ. විමලේන්තිරරාජා**
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්** -

- ලේකම්, වෙළඳ, වානිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
- ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
- රේගු අධ්‍යක්ෂ ජනරාල්, - මේ සමග එවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන සහ 5 වන වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - *වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා*
- අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව-වෙබ් පිටුවේ පළකිරීම සඳහා

Government Notification
Special Commodity Levy Act, No. 48 of 2007
Order under Section 2 and 5

1. By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, I, Ranil Wickremesinghe, Minister of Finance, Economic Stabilization and National Policies of the Democratic Socialist Republic of Sri Lanka, do by this order impose in respect of the commodity specified in Column I of the Schedule hereto a Special Commodity Levy at the rate specified in the corresponding entry in Column II of that Schedule.

SCHEDULE

| Column I | | | | Column II |
|---|---|---|---|---|
| Commodity Item | | | | Special Commodity Levy |
| | H. S. Heading | H.S .Code | Description | |
| 1. | 07.03 | 0703.10.30 | Other onions | Rs. 10 per Kg |

This Order under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, shall be valid till April 30 2024 commencing from March .27.., 2024 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

2. By virtue of the powers vested in me by Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007, I, Ranil Wickremesinghe, Minister of Finance, Economic Stabilization and National Policies of the Democratic Socialist Republic of Sri Lanka, do hereby make an order to waive-off balance amount after collecting Rs. 1 per kg from the applicable Special Commodity Levy of Rs. 65 per kg on importation of rice, classified under the HS Code of 1006.30.29, as ordered in the Extraordinary Gazette Notification No. 2332/14 of May 17, 2023 .

This waive-off of the Special Commodity Levy is applicable to any importer, who had obtained import control license from the Controller General, Department of Imports and Exports Control on the recommendation of the Secretary, Ministry of Trade, Commerce and Food Security on or before January 21, 2024 and importation of such quantity of rice should have been made with the Bill of Lading (BL) or Air Way Bill (AWB) dated during the period of January 02, 2024 from January 21, 2024.

This Order under Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007, shall be valid till .April..... ..03...,. 2024 commencing from March .27.., 2024 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

**Ranil Wickremesinghe**
**Minister of Finance, Economic Stabilization and National Policies**

March 25........, 2024
Ministry of Finance, Economic Stabilization and National Policies
Colombo 01.

, 2024 05:17 PM FAX RECEIVED 26/03/2024 17:05 0003

02

රජයේ නිවේදනය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

උපලේඛනය

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතාංකය | විස්තරය | |
| 1. | 07.03 | 0703.10.30 | අළුතකුත් එනු | කි.ග්‍රෑමයට රු.10 |

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ මෙම නියමය, එකී පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව 2024 මාර්තු මස 27 දිනෙන් ආරම්භ වී 2024 අප්‍රේල් මස 30 වැනි දින දක්වා වලංගු වේ.

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, සංගෘහීත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය වන සහල් ආනයනය කිරීමේ දී 2023 මැයි 17 දිනැති අංක 2332/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 65ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝ ග්‍රෑමයක් සඳහා රු.1ක් අයකර ගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබීම සඳහා මෙයින් නියමයක් පනවමි.

මෙම විශේෂ වෙළඳ භාණ්ඩ බදු අත්හැරීම වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙතින් 2024 ජනවාරි 21 වැනි දිනට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගෙන ඇති ඕනෑම සහල් ආනයනකරුවෙකු සඳහා අදාළ වන අතර, 2024 ජනවාරි 02 සිට 2024 ජනවාරි 21 දක්වා කාල සීමාවට අදාළ වන දිනයක් සහිත නෞභාර පත්‍රයක් (BL) හෝ ගුවන්භාර පත්‍රයක් (AWB) සහිතව එම සහල් ප්‍රමාණයන් ආනයනය කිරීම සිදුකර තිබිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තියේ යටතේ වූ මෙම නියමය, එකී පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව 2024 මාර්තු මස 27 දින සිට ආරම්භ 2024 අප්‍රේල් මස 03 වැනි දින දක්වා වලංගු වේ.

රනිල් වික්‍රමසිංහ
මුදල්, ආර්ථික ස්ථායීකරණ
සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2024 මාර්තු මස 25 වැනි දින
කොළඹ 01
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.